**මීගමුව මහා නගර සභාව**
**ගම්පහ දිස්ත්‍රික්කය**
**-------------------------**

1. <u>මූල්‍ය ප්‍රකාශන.</u>

1.1 <u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.</u>

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 31 දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 අප්‍රේල් 30 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 අගෝස්තු 23 දින සභාවේ නාගරික කොමසාරිස්වරයා වෙත යවා ඇත.

1.2 **තත්ත්වාගණනය කළ මතය**

--------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට මීගමුව මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u>

1.3.1 <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

පහත සඳහන් අඩුපාඩු නිරික්ෂණය කරනු ලැබේ.

(අ) සභාවේ ස්ථාවර තැන්පත් හා ස්ථාවර තැන්පත් නිදන් අරමුදල සඳහාවූ පොලිය රු.248,527 ක් වැඩියෙන් ගණනය කර සමාලෝචිත වර්ෂයේ ආදායමට ගෙන තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ පුස්තකාල පොත් සමීක්ෂණයට අනුව මහා නගර සභාවට අයත් පුස්තකාල 07 ක 100398 ක පොත් ප්‍රමාණයක් පැවතියද, මෙම පොත් තොගයේ වටිනාකම ගණනය කොට ගිණුම් ගත කිරීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි.

(ඇ) මහා නගර සභාවේ පුස්තකාලය සඳහා 2015 වර්ෂය සඳහා රු.31,255 ක් වටිනා පොත් 147 ක් පරිත්‍යාග ලෙස ලැබී තිබූ අතර, මෙම පරිත්‍යාග ගිණුම් ගත කිරීමට කටයුතු කොට නොතිබුණි. එසේම සමාලෝචිත වර්ෂයතෙක් පරිත්‍යාග වශයෙන් ලැබී තිබුණු කිසිදු පොත් තොගයක් ගිණුම් ගතකොට නොතිබුණි.

(ඈ) 2014 වර්ෂයේ කාමච්චෝඩේ පොළ සඳහා පළාත් බද මාර්ග සංවර්ධන අධිකාරියෙන් ආධාර ලෙස ලැබූ රු.20,046,589 ක් වටිනා භාණ්ඩ තොගයේ වටිනාකම ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ පළාත් සංවර්ධන වැඩ වෙනුවෙන් ගිවිසුම්වලට එළඹ තිබූ වටිනාකම රු.9,388,784 ක් වූ කොන්ත්‍රාත් 20 සම්බන්ධයෙන් අවසන් මූල්‍ය ප්‍රකාශවල හෙළිදරව් කිරීම් කර නොතිබුණි.

(ඊ) උපචිත පදනම අනුව අදාල කාලපරිච්ඡේදයට අදාල ගණුදෙනු මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කල යුතු වුවත්, 2014 වර්ෂය හා ඊට පෙර වර්ෂයන් තුල සිදුවී තිබූ ගණුදෙනු සම්බන්ධයෙන් ගිණුම්වල ප්‍රතිපාදන සිදු නොකිරීම නිසා සමාලෝචිත වර්ෂයේ රු.2,060,445 ක වටිනාකමක් සමුච්චිත අරමුදලින් කපා හැර තිබුණි.

1.3.2 <u>නොසැසඳු පාලන ගිණුම්</u>

2015 දෙසැම්බර් 31 දිනට ගිණුම් විෂයයන් 10 කට අදාලව පාලන ගිණුම අනුව ශේෂයන්ගේ එකතුව රු.125,832,924 ක්වූ අතර ඒවාට අදාල ලේඛන/උපලේඛන අනුව එම ශේෂයන්ගේ එකතුව රු.125,408,188 ක් වූයෙන් රු.424,736 ක වෙනසක් විය.

1.3.3 <u>ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්</u>

(අ) දිගු කාලයක සිට ආයෝජන පොලී ලෙස ඉදිරියට ගෙන එන රු.2,820,895 ක් වූ ශේෂය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2015 දෙසැම්බර් 31 දිනට හිඟහිටි වෙනත් ආදායම් ශේෂය රු.200,459,303 ක් වූ අතර, එම ශේෂයට වසර 12 කට වැඩි ශේෂයන් 12 ක් ඇතුලත්ව තිබුණි.

(ඇ) 2015 දෙසැම්බර් 31 දිනට පෙර ගෙවුම් ශේෂය රු.38,463,230 ක් වූ අතර, රු.1,414,977 ක නිරවුල් නොවූ අගරු චෙක්පත් ශේෂයක්ද ඊට ඇතුලත්ව තිබුණි. 1992 සිට 2013 කාලයට අදාල රු.1,333,950 ක් වූ අගරු චෙක්පත් 91 ක් සම්බන්ධයෙන් මෙතෙක් කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

(ඈ) 2004 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා කාලය සඳහා ගෙවිය යුතු විශ්‍රාම වැටුප් දායක මුදල් රු.15,771,794 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) 1986 වර්ෂයේ සිට 2010 දක්වා කාලයකට අදාල ගබඩා ණය ගැති ශේෂය රු.6,983,011 ක් වූ අතර, මෙම ශේෂ නිරවුල් කිරීම සඳහා කටයුතු කර නොතිබුණි.

(ඊ) 1981 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා වූ විවිධ ණයගැති ශේෂය රු.18,212,201 ක් වූ අතර, එම ශේෂයන් අයකර ගැනීම සඳහා කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

(උ) 2015 දෙසැම්බර් 31 දිනට පැවති පොදු සැපයුම් ණයහිමි ශේෂ වටිනාකම රු.49,417,305 ක් වූ අතර, වසර 10 කට වැඩි කාලයක සිට පැවත එන රු.2,058,390 ක ශේෂයක්ද ඊට ඇතුලත්ව තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් මෙම ශේෂයන් නිරවුල් කර නොතිබුණි.

1.3.4 <u>විගණනය සඳහා සාක්ෂි නොවීම</u> .

(අ) <u>පිළිතුරු නොලත් විගණන විමසුම්</u>.

2007 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා කාල පරිච්ඡේදයට අදාල විගණන විමසුම් 23 කට 2016 ජූනි 30 දින වන විටත් පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) <u>තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම</u>.

එකතුව රු.129,571,627 ක්වූ විෂයයන් 06 ක් සඳහා උපලේඛන හා ශේෂ සනාථ කිරීම් ඉදිරිපත් නොකිරීම නිසා ඒවා විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

1.3.5 නීති රීති රෙගුලාසි වලට අනුකූල නොවීම.

පහත දැක්වෙන නීති රීති, රෙගුලාසි විධිවිධාන වලට හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 396 (ඇ) ප්‍රකාරව බැංකු ජංගම ගිණුමේ නිකුත් කර මාස 06 කට වඩා වැඩි කාලයක් ඉකුත්ව තිබූ රු.171,376 ක් වූ චෙක්පත් 15 ක් සම්බන්ධයෙන් යොමුගත රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 881 ප්‍රකාරව හා රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනත අනුව ඇප ලබාගත යුතු නිලධාරීන්ගෙන් ප්‍රමාණවත් ඇප මුදලක් ලබාගෙන නොතිබුණි.

(ඇ) 1988 අප්‍රේල් 20 දිනැති අංක 20/88 දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය ප්‍රකාරව, හිඟ ආදායම් කුමන වකවානුවලට අයත්දැයි දැක්වෙන ප්‍රකාශයක් සකස් කර, යටත් පිරිසෙයින් තුන් මසකට වරක්වත් සභාවට ඉදිරිපත් කිරීමට සැලැස්විය යුතු වුවත්, එසේ කර නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු.126,398,161 ක්වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු. 102,180.961 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

නගරාධිපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම් , තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳව තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිගය |
|---|---|---|---|---|
| | | '000 රු. | '000 රු. | '000 රු. |
| (i) | වරිපනම් හා බදු | 157,040 | 152,795 | 95,220 |
| (ii) | බදු කුලී | 17,383 | 22,422 | 14,563 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 37,772 | 30,176 | 12,179 |
| (iv) | වෙනත් ආදායම් | 198,800 | 229,017 | 2,818 |
| | **මුළු එකතුව** | **410,995** | **434,410** | **124,780** |

2.2.2 වරිපනම් හා බදු

කොච්චිකඩේ බල ප්‍රදේශය සඳහා 2007වර්ෂයෙන් පසුව වරිපනම් බදු තක්සේරුවක් සිදුකර නොතිබූ නිසා වාර්ෂිකව වරිපනම් බදු වශයෙන් ලබාගත හැකිව තිබූ විශාල ආදායමක් සභාවට අහිමිවී තිබුණි.

2.2.3 වෙළඳ බලපත්‍ර ගාස්තු

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2014 වර්ෂයේ බලපත්‍ර ගාස්තු අයකර තිබූ ව්‍යාපාර 26 කට අදාල ආයතන 152 කින් සමාලෝචිත වර්ෂයේදී බලපත්‍ර ගාස්තු අයකර නොතිබීම හේතුවෙන් රු.368,155 ක බලපත්‍ර ගාස්තුවක් සභාවට අහිමිවී තිබුණි.

(ආ) මහා නගර සභා බලප්‍රදේශයේ පවත්වාගෙන යනු ලබන ශ්‍රී ලංකා සංචාරක මණ්ඩල පනත යටතේ ලියාපදිංචි කර තිබූ හෝටල්, ලැගුම්හල් හා ආපනශාලා 27 ක් සඳහා සමාලෝචිත වර්ෂයේදී බලපත්‍ර ගාස්තු අයකර නොතිබුණි.

(ඇ) මහා නගර සභා ආඥා පනතේ 247(අ) හා (ආ) ප්‍රකාරව ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ලියාපදිංචිකර ඇත්තාවූ හෝ අනුමත කර ඇති හෝටල් ආපනශාලා හා නවාතැන් පොළවල්වල ලැබීම්වලින් සියයට 01 ක් ලෙස බලපත්‍ර ගාස්තු අයකළ යුතු විය. 2015 වර්ෂය සඳහා බලපත්‍ර ගාස්තු පැනවීමේදී ආපනශාලාවලින් පමණක් සියයට 01 ක් අයකිරීමටත්, හෝටල් හා ලැගුම්හල්වලින් කාමරයක් සඳහා රු.3,221 ක් බැගින් ගාස්තුවක්- අයකිරීමටත් තීරණය කර ආපනශාලා 08 කින් වෙළඳ බලපත්‍ර සියයට 01 ක ගාස්තුවක්ද, හෝටල් 17 කින් හා ලැගුම්හල් 03 කින් කාමර සංඛ්‍යාව අනුව ගාස්තුද අයකර තිබුණි.

2.2.4 මීගමුව බස් නැවතුම්පලේ බස්ගාලේ ගාස්තු අයකිරීම.

මීගමුව බස් නැවතුම්පල බස්ගාලේ ගාස්තු අයකිරීම් සම්බන්ධයෙන් 2015 ජනවාරි 01 දින කරන ලද නියැදි විගණන පරීක්ෂාවේදී පහත කරුණු අනාවරණය විය.

(අ) සේවා මුර ක්‍රමය අනුව බස්ගාල් ගාස්තු සම්බන්ධ රාජකාරී ඉටුකිරීමට සේවකයින් දෙදෙනෙකු යොදවා තිබුණ අතර , බස්රථ බස් නැවතුම්පලට ඇතුළු කිරීමේදී රු.50 ක අවසරපතක් නිකුත් කලයුතුව තිබුණි. මෙම අවසරපත්වල බස්රථ අංකය, පැමිණීම, පිටවීම, දිනය හා අයකැමි අත්සන යෙදිය යුතු වුවත් අවසරපත් පරීක්ෂාවේදී එපරිදි කටයුතු කර නොතිබුණි.

(ආ) දෛනිකව එකතු කරනු ලබන බස්ගාල් ගාස්තු එදිනම කාර්යාලයට ගෙවිය යුතු වුවත්, ගාස්තු අයකරන සේවකයින් දින 01 ත් 07 ත් අතර කාලයක් මුදල් අත රඳවාගෙන ප්‍රේෂණය කිරීම ප්‍රමාද කර තිබුණි.

(ඇ) බස්නාහිර පළාතේ මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ බස්රථ ධාවනය පිළිබඳ දෙසති වාර්තාව අනුව බස්රථ නැවතුම්පලින් ගමන් කල වාර ගණන හා සැසඳීමේදී එකතු කර ඇති බස්ගාල් ගාස්තු ඌණතාවයක් ඇති බව නිරීක්ෂණය විය. එම වාර්තා අනුව 2015 මාර්තු 16 සිට 30 දක්වා කාලය සඳහා අයවිය යුතු ගාස්තුව රු.355,200 ක් වන අතර, කාර්යාලයට ගෙවා ඇති ගාස්තුව රු.178,950 ක් වූයෙන් සභාවට රු.176,250 ක් අඩුවෙන් ලැබී තිබූ බව අනාවරණය විය.

2.2.5 ඝන අපද්‍රව්‍ය අපහරණ ගාස්තු

2008 ජූලි 30 දිනැති අංක 1560/6 ගැසට් නිවේදනයේ පළකර ඇති 2008 අංක 01 දරණ "ඝන අපද්‍රව්‍ය කළමණාකරණ රීති " සියළුම පළාත් පාලන ආයතන ක්‍රියාත්මක කළයුතු බවට 2010 දෙසැම්බර් 21 දිනැති අංක.එල්ජීඩී/05/08/පොදු/වෙළුම දරන බස්නාහිර පළාත් පාලන කොමසාරිස්ගේ ලිපියෙන් දැනුම්දී තිබුණද, නගර සභාව එය ක්‍රියාත්මක කර නොතිබුණි. සමාලෝචිත වර්ෂයේ ඒ වෙනුවෙන් ආදායම් ඇස්තමේන්තු කර නොතිබුණු අතර, මේ හේතුවෙන් රීතිවල දක්වා තිබූ ආදායම් සභාවට ලැබී නොතිබුණි.

2.3 <u>අධිභාර</u>

මහ නගර සභා ආඥා පනතේ (252 වන අධිකාරය) 226 (1) විධිවිධාන යටතේ වගකිවයුතු පුද්ගලයන්ට එරෙහිව 1995 වර්ෂයේ සිට විගණකාධිපතිවරයා විසින් පනවන ලද අධිභාර අනුව 2015 දෙසැම්බර් 31 දිනට අයකර ගැනීමට තිබුණ අධිභාරවල අගය රු.24,854,584 ක් විය.

3. <u>මෙහෙයුම් සමාලෝචනය</u>

3.1 <u>කළමණාකරණ අකාර්යක්ෂමතා</u>

3.1.1 <u>බැංකු අයිරා</u>

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 387 අනුව බැංකු අයිරා ලබානොගත යුතුව තිබියදී සභාව විසින් 2007 වර්ෂයේ සිට දිගින් දිගටම බැංකු අයිරා ලබා ගෙන තිබුණි. 2015 මැයි 26 දින දක්වා තිබූ රුපියල් ලක්ෂ 200 ක බැංකු අයිරා සීමාව 2015 මැයි 27 දින සිට රුපියල් ලක්ෂ 250 දක්වා වැඩිකර ගෙන තිබූ අතර, ඒ සඳහා රු.31,200,000 ක් වටිනා ස්ථාවර තැන්පත් ඇපයට තබා තිබුණි.

(ආ) සභාව සතුව රුපියල් ලක්ෂ 467 ක් වටිනා ස්ථාවර තැන්පත් තිබියදීත් බැංකු අයිරාව නිරවුල් කරගැනීම වෙනුවට තවදුරටත් අයිරාව වැඩිකර ගැනීම මූල්‍ය පාලනයේ දුර්වලතාවයක් ලෙසට විගණනයේදී නිරීක්ෂණය විය. 2007 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා බැංකු අයිරා පොලී වශයෙන් රු.14,146,254 ක් ගෙවා තිබුණි.

3.1.2 <u>ආපදා ණය</u>

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ආපදා ණය සඳහා වෙනම බැංකු ගිණුමක් පවත්වා තිබූ අතර, 2015 වර්ෂයේදී සභාවේ පොදු මුදල් ගිණුමෙන් මෙම ගිණුමට රු.2,500,000 ක් මාරුකර තිබුණි. 2015 දෙසැම්බර් 31 දිනට ආපදා ගිණුමේ ශේෂය රු.2,608,211 ක් විය.මේ නිසා මාරු කර තිබූ මුළු ශේෂය ඉතිරිව් තිබූ හෙයින් සභාවේ අරමුදල් මෙම ගිණුමේ අනවශ්‍ය හිරකර තබා ගැනීමක් සිදුව තිබූ බව නිරීක්ෂණය විය.

(ආ) ලබාගත හැකි ආපදා ණය මුදල රු.2,50,000 කට සීමාකර තිබුණද, නිලධාරීන් දෙදෙනකුට එම සීමාව ඉක්මවා ආපදා ණය මුදල් ගෙවා තිබුණි.

(ඇ) ප්‍රතිපාදන ඇති බව තහවුරු කර ගැනීමකින් පසු ගිවිසුම්වලට එළඹීම සභාවේ වගකීම වුවත් වටිනාකම රු .9,092,906 ක්වූ සභාවේ ව්‍යාපෘති 12 ක් සඳහා ප්‍රතිපාදන නොමැතිව සමාලෝචිත වර්ෂයේදී ගිවිසුම්වලට එළඹ තිබුණි.

3.1.3 <u>අනවසර ඉදිකිරීම්</u>

ඉන්ධන පිරවුම්හලක් ඉදිකිරීම සඳහා ගොඩනැගිලි අයදුම්පතක් අනුමත කිරීම සඳහා කොච්චිකඩේ උප කාර්යාලයට 2015 ජනවාරි 28 දින ඉදිරිපත් කර තිබුණි. මෙම අයදුම්පතට අනුමැතිය ලබාදීම සඳහා මාර්ග සංවර්ධන අධිකාරියෙන් මාර්ග නිරවුල් පිළිබඳ සහතිකයක් ලබා දෙන ලෙස 2015 පෙබරවාරි 16 දින නගරාධිපතිවරයා විසින් අයිතිකරුට දන්වා තිබුණි. මෙම ඉදිකිරීම අනවසර ඉදිකිරීමක් බව මාර්ග සංවර්ධන අධිකාරිය මගින් දන්වා තිබියදීත්, ගොඩනැගිලි අයදුම්පත අනුමත කර තිබූ අතර 2016 මැයි මාසය වනවිට එම ව්‍යාපාරය ආරම්භ කර තිබුණි.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

3.2.1 කොච්චිකඩේ බල ප්‍රදේශයේ කසළ ඉවත් කිරීම

(අ) කොච්චිකඩේ බල ප්‍රදේශයේ කසල ඉවත් කිරීම සඳහා මිළ කැඳවීම් කර ගිවිසුම්ගතව තිබූ අතර නගර සභා ප්‍රධාන සෞඛ්‍ය පරීක්ෂක හා කොච්චිකඩේ බල ප්‍රදේශ සෞඛ්‍ය පරීක්ෂකවරයෙකුගේද සහභාගිත්වයෙන් 2015 ඔක්තෝබර් 12 සිට 15 දක්වා කරන ලද ස්ථානීය පරීක්ෂාවේදී පහත සඳහන් ගිවිසුම්ගත කාර්යයන් ඉටුවී නොමැති බව නිරීක්ෂණය විය.

* පාරවල් සහ සිමෙන්ති කාණු අතුගෑම සහ අවශ්‍ය ස්ථාන පිරිසිදු කිරීම.
* බෝක්කුවල ඇතුල් පැති හා කාණු පිරිසිදු කිරීම.
* අනවශ්‍ය පැලෑටි කොඩිවැල් පෝස්ටර් හා සැරසිලි ඉවත් කිරීම.
* ඕවිටියාවත්ත කසල භූමියේ කසල තුනී කර බොරළු දැමීම 2015 අගෝස්තු මාසයේ සහ ඔක්තෝබර් මාසවල සිදුකර නොතිබුණි.

(ආ) කසල ඉවත් කිරීමේ ගිවිසුම ප්‍රකාරව අදාල කාර්යයන් ඉටු නොවූ අවස්ථාවලදීද එම කාර්යයන් සාර්ථකව ඉටුකර ඇති බවට ලිඛිතව දක්වා ගෙවීම් සිදුකර තිබුණි. අධීක්ෂණ නිලධාරින්ගේ කාර්යය නියමිත පරිදි ඉටුවී නොතිබුණි.

3.2.2 මීගමුව නව බස්නැවතුම්පොල සාප්පු සංකීර්ණයේ ශාලා බදුදීම.

දෙවන මහලේ ඉදිකිරීම්වල අඩුපාඩු හේතුවෙන් අංක 66 කඩ කාමරය 2014 වර්ෂයේ සිට බදු දීමට සභාවට නොහැකි වී තිබුණි.

3.2.3 වීථි ලාම්පු පිළිබඳ පාලනය

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2015 ජනවාරි 01 සිට 2015 දෙසැම්බර් 04 දින දක්වා කාලය තුල ගබඩාවෙන් වීථි ලාම්පු 1671 ක් නිකුත් කර තිබූ අතර, ඒ වෙනුවට ඉවත් කල වීථි ලාම්පු උපකරණ ආපසු ගබඩාවට භාරදීමේ ක්‍රමයක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) ගබඩාවේ වීථි ලාම්පු 17 ක හා විදුලි අංශයේ වීථි ලාම්පු 140 ක ඌණතාවයක් 2015 දෙසැම්බර් 02 දින කරන ලද භෞතික පරීක්ෂාවේදී අනාවරණය විය.

(ඇ) විදුලි අංශය මගින් ගබඩාවෙන් ලබාගන්නා වීථි පහන් ලැබීම් හා නඩත්තු කටයුතු (සවිකිරීම්) පිළිබඳ විස්තර ඇතුලත් ලේඛණයක් නඩත්තුකර නොතිබුණි.

(ඈ) සභාවේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව වීථි පහන් කණු අංක කිරීමේ ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණද ,මෙතෙක් එය ක්‍රියාත්මක කර නොතිබුණි.

3.3 කොන්ත්‍රාත් පාලනය

3.3.1 මීගමුව නව බස්නැවතුම්පල විද්‍යුත් පඩිපෙළ )Escalator) නඩත්තු කිරීම.

යථෝක්ත පඩිපෙළෙහි නඩත්තු කාලය 2012 නොවැම්බර් මාසයෙන් අවසන් බව දක්වමින් වාර්ෂිකව නඩත්තු කටයුතු සඳහා රු.466,839 ක මුදලක් 2013 සිට 2015 වර්ෂය දක්වා පුද්ගලික ආයතනයක් වෙත ගෙවා තිබුණි. යථෝක්ත පඩිපෙළ බස් නැවතුම්පළ තුළ 2011 වර්ෂයේ සිට ක්‍රියාත්මක නොවන බවත් ඒ අනුව ක්‍රියාත්මක නොවන පඩිපෙළ නඩත්තුව සඳහා කල ගෙවීම් නිශ්කාර්යය වියදමක් විය.

3.3.2 <u>2014 වර්ෂයේ බොරළු සැපයීම.</u>

ක්‍රීඩාංගන 04 ක් සඳහා බොරළු සැපයීම සඳහා වර්ෂය ආරම්භයේදී මිළ ගණන් කැඳවීම් කර සැපයුම්කරුවන් ලියාපදිංචි කර තිබියදීත් කොන්ත්‍රාත් පදනම මත බොරළු මිලදී ගෙන තිබූ අතර, ඒ පිළිබඳව පරීක්ෂා කිරීමේදී පහත සඳහන් කරුණු අනාවරණය විය.

(අ) 2014 වර්ෂයේ බොරළු සැපයීම සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කර තිබියදී හා බොරළු තුනී කිරීම සඳහා යන්ත්‍රෝපකරණ සභාව සතුව තිබියදී ක්‍රීඩාංගණ සංවර්ධනය කිරීම සඳහා කොන්ත්‍රාත් පදනම මත බොරළු කියුබ් 2041.2 ක් මිලදී ගෙන තුනී කිරීම සඳහා රු.7,069,045 ක් ගෙවා තිබුණි.

(ආ) සභාව සතු බැකෝ ලෝඩරයක් හා ස්කිඩ්ලෝඩර් දෙකක් තිබියදී ඒවායේ සේවය ලබා නොගෙන වෙනත් පෞද්ගලික ආයතනයකින් සේවය ලබාගෙන තිබුණි.

(ඇ) ලියාපදිංචි සැපයුම්කරුවන්ගේ අවම මිල ගණන් යටතේ බොරළු මිලදී නොගෙන කොන්ත්‍රාත් පදනම මත මිළදී ගැනීම් සිදුකර සංවර්ධන කටයුතු සිදු කර තිබුණි.

3.3.3 <u>ඇල මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම</u>.

එක් ගමකට එක් වැඩක් - සංවර්ධන වැඩ සටහන යටතේ, දළුවකොටුව වසමේ සියළු ඇල මාර්ග ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘති වෙනුවෙන් මීගමුව ප්‍රාදේශීය ලේකම්වරයාගෙන් 2014 වර්ෂයේදී රු. 2,000,000 ක ප්‍රතිපාදන ලැබී තිබුණි. මේ සඳහා රු. 1,993,290 ක ඇස්තමේන්තුවක් සකස් කර එම කොන්ත්‍රාත්තුව රු.1,737,020 ක මිලකට පෞද්ගලික ආයතනයකට පිරිනමා තිබුණි. ඒ අනුව 2014 සැප්තැම්බර් 10 දින එළඹ තිබූ ගිවිසුම මාස 02 ක් ඇතුලතදී කර්මාන්තය සම්පූර්ණ කොට භාර දිය යුතු විය. 2014 නොවැම්බර් 01 දින වැඩ අවසන් බව දන්වා තිබූ අතර, 2015 මාර්තු 25 දින රු.1,841,241ක් කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) මෙම ව්‍යාපෘතිය අනුමත ඇස්තමේන්තු අනුව නිමකර නොමැති බවත්, ඉටු නොකරන ලද වැඩ වෙනුවෙන් බිල්පත් ඉදිරිපත් කිරීම කණගාටුවට කරුණක් බවත්, අධීක්ෂණය හා බිල්පත් සඳහා නිර්දේශ ඉදිරිපත් කරන නිළධාරීන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කරන ලෙසත් ප්‍රාදේශිය ලේකම්වරයා 2014දෙසැම්බර් 04 දින දන්වා තිබුණි. 2014 නොවැම්බර් 11 දින සභාවේ ඉංජිනේරුවරයාගේ හා තාක්ෂණික නිලධාරීගේ මිනුම් වාර්තාව අනුව ඔහු විසින් මිනුම් පරීක්ෂා කල බවත්, නිවැරදි බවත්, සහතික කර තිබූ අතර, 2014 නොවැම්බර් 26 දින නාගරික කොමසාරිස් විසින් නිර්දේශ කර 2014 නොවැම්බර් 27 දින නගරාධිපති විසින් ගෙවීම් අනුමත කර තිබුණි.

(ආ) එම ව්‍යාපෘතිය තාක්ෂණික නිලධාරි සහ සංවර්ධන නිලධාරි , ග්‍රාම නිලධාරීන් සහභාගීත්වය ඇතිව නිම කර භාර දෙන ලෙස 2014 දෙසැම්බර් 17 දිනැති ලිපියෙන් නාගරික කොමසාරිස් විසින් අදාල කොන්ත්‍රාත්කරු වෙත දන්වා තිබුණි.

(ඇ) 2015 මැයි 11 දිනැති ප්‍රාදේශිය ලේකම්වරයාගේ ලිපිය පරිදි ගෙවීම් සඳහා සෑහිමට පත්විය නොහැකි තත්වයන් පවතින බවත් ඉටුකල වැඩ කොටස් පිළිබඳව සත්‍ය තක්සේරුවක් සිදුකර අදාල ගෙවීම් වවුචර් ඉදිරිපත් කරන ලෙසත් දන්වා තිබුණි.

(ඇ) ඉටුනොකරන ලද ව්‍යාපෘතියේ කටයුතු සම්බන්ධයෙන් නිර්දේශයන් හා සහතික කිරීම් සිදුකරන ලද නිළධාරින් පිළිබඳව සභාව විසින් කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

3.4.4 <u>මංකුලිය ක්‍රීඩාංගණය සංවර්ධනය කිරීම.</u>

මංකුලිය ක්‍රීඩාංගණය සංවර්ධනය සඳහා බොරළු සපයා ගොනු කිරීම සහ ගොනු කල බොරළු තුනීකර රෝල යොදා තැලීම සඳහා බොරළු කියුබ් 510.3 කට ඇස්තමේන්තු සකස් කර 2014 මැයි 16 දින රු.1,776,149 ක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි. ප්‍රමාණ පත්‍රය අනුව අඩි 360ක් දිග සහ අඩි 189ක් පළල උස අඩි 0.75ක් සඳහා කියුබ් 510.3ක් මිළදී ගැනීමට ඇස්තමේන්තු කර තිබූ අතර, බොරළු තුනී කිරීමට පෙර ගොනුගත කර මිනුම් ගැනීම සඳහා අධීක්ෂණ නිලධාරියෙකු සහභාගී වී නොතිබූ බව 2015 මාර්තු 04 දින කරන ලද පරීක්ෂාවේදී අනාවරණය විය.

3.4 <u>මතභේදයට තුඩුදුන් ගනුදෙනු.</u>

කාමච්චෝඩේ බදාදා හා ඉරිදා පොළ බදුදීම සම්බන්ධයෙන් 2015 අප්‍රේල් 16 දින සිදුකල පරීක්ෂාවේදී පහත කරුණු අනාවරණය විය.

(අ) 2014 සැප්තැම්බර් 22දිනැති අංක 625 දරණ මුදල් කාරක සභා නිර්දේශ හා 2014ඔක්තෝබර් 02දිනැති අංක 5/5 දරණ සභා සම්මුතිය පරිදි කාමච්චෝඩේ බදාදා පොළ 2014 වර්ෂයේ බදුදෙන ලද මුදලට සියයට 10ක් වැඩිකර 2015 වර්ෂයට නව පොළ විවෘත කරන තුරු බදු දීමටත් ,ඒ සඳහා බදුකරුගෙන් ලිපියක් ලබාගැනීමටත් තීරණය කර තිබුණි.

(ආ) පොළ විවෘත කිරීමෙන් පසු එළවළු සහ පළතුරු, රෙදි, කරවල වශයෙන් කොටස් තුනක් ලෙස ටෙන්ඩර් කිරීමට තීරණය කර තිබූ නමුත්, නව වෙළඳපල විවෘත කරනතුරු පමණක් යන්න ගිවිසුමට ඇතුලත් නොකර 2015 ජනවාරි මස 01 දින සිට 2015 දෙසැම්බර් මස 31 දින දක්වා වලංගු වන පරිදි 2014 දෙසැම්බර් මස 18 දින ගිවිසුම් වලට එළඹ තිබුණි.

3.5 <u>නිශ්කාර්ය වත්කම්</u>

2015 පෙබරවාරි 06 දින රාජ්‍ය පරිපාලන, පළාත් සභා, පළාත් පාලන හා ප්‍රජාතාන්ත්‍රික පාලනය පිළිබඳ අමාත්‍යාංශයෙන් පළාත් පාලන ආයතන සවිබල ගැන්වීම සඳහා ප්‍රදානයක් ලෙස මෝටර් ග්‍රේඩරයක්, ට්‍රක්රථයක් හා Single drums vibrating roller එකක් සභාවට ලැබී තිබූ අතර, මෝටර් ග්‍රේඩරය හා ට්‍රක්රථය 2015 නොවැම්බර් 10 දින දක්වාත් කිසිදු කාර්යයකට නොයොදවා නිෂ්කාර්යව තිබුණි.

4. <u>ගිණුම් කටයුතු භාවය සහ යහ පාලනය</u>

4.1 <u>ප්‍රසම්පාදන සැලැස්ම</u>

2006 මාර්තු 24 දිනැති අංක 128 දරණ ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාර වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

4.2 <u>අයවැය පාලනය</u>.

සමාලෝචිත වර්ෂය සඳහා වැය විෂයයන් 09 ක් වෙනුවෙන් ප්‍රතිපාදිත මුදලින් කිසිදු මුදලක් භාවිතා කර නොතිබූ හෙයින්, අයවැය ඵලදායී පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

4.3 <u>කාර්ය සාධනය</u>

වාර්ෂික කාර්ය සාධන සැලැස්මේ ඇතුලත් ක්‍රියාකාරකම් 10 ක් සමාලෝචිත වර්ෂය තුළදී ඉටු කිරීමට සභාව අපොහොසත් වී තිබුණි.

5. <u>පද්ධති හා පාලන</u>

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) මූල්‍ය පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඇ) වත්කම් කළමනාකරණය